https://www.nipunadhamma.org

දස සංයෝජන

පූජ්‍යපාද දොළොස්වල උදිතධීර හිමි

පුණ්‍යානුමෝදනාව

"ධම්මෝසධ සමං නත්ථි - ඒතං පිවථ භික්ඛවෝ" යනුවෙන් තථාගතයන් වහන්සේ දේශනා කළ පරිදි ධර්මය හා සමාන වූ වෙනත් ඖෂධයක් නොමැත. එම ධර්මය නමැති ඖෂධය පානය කිරීම යනු ධර්ම ශ්‍රවණය, දහම් පොතපත කියවීම, ධර්මය සජ්ඣායනය, ධර්මය මෙනෙහි කිරීම, ධර්මය සාකච්ඡා කිරීම, සීල සමාදානය හා භාවනාව ආදී ශාසනික ගුණධර්මයන්හි නිරත වීමයි. එවන් උදාර ශාසනික ගමනකට මංපෙත් විවර කරනු රිසියෙන් මෙම දහම් පොත ඔබ අතට පත් කරන්නෙමු.

මේ සියලු පින් පින්වත් ඔබ සැමගේ මෙලොව යහපතටත්, පරලොව සුගතියටත්, කෙළවර ශාන්ත අමා නිවන් සුව පිණිසත් හේතු වාසනා වේවා!

මෙයට - සම්පාදක

පූජනීය දොළොස්වල උදිතධීර හිමි.

ධම්මදස්සි බෞද්ධ මධ්‍යස්ථානය,

කල්‍යාණි මාවත, කොට්ටුන්න, බියගම.

https://www.nipunadhamma.org

සක්කාය දිට්ඨිය

මගේ සිත, මගේ කය, මගේ රූපය, මගේ ඇස, මම හිතන විදිහට, මම කල්පනා කරන විදිහට මම දකිමි; මම යමි, මම කමි, මම බොමි, මම නාමි ආදී වශයෙන් මේ වචන නිතර අප විසින් භාවිතා කරනු ලබනවා. මේ වචනවලින් කියවෙන්නේ මම කියා කෙනෙක් ඇති බවයි. නැතහොත් මම කියා කෙනෙක් ඇති බව එම වචනවලින් හැඟෙයි. එම හැඟෙන ස්වභාවය, එම සිතුවිල්ල, එම අදහස, එම සංකල්පනාව සක්කාය දිට්ඨියයි.

සක්කාය යනු රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන පංච උපාදානස්කන්ධය හඳුන්වන වචනයකි. ඒ බව මජ්ඣිම නිකායේ චූල වේදල්ල සූත්‍රයෙහි සඳහන් වෙයි.

දිට්ඨිය යනු පංච උපාදානස්කන්ධය තුළ සත්වයෙක් ඇත, පුද්ගලයෙක් ඇත, ආත්මයක් ඇත, මම කියා කෙනෙක් ඇත යනුවෙන් වරදවා සිතන, කල්පනා කරන, අදහස් කරන ස්වභාවයයි.

සක්කාය දිට්ඨි විස්සක් පිළිබඳව බොහෝ සූත්‍ර දේශනාවල සඳහන් වී තිබේ. එම සක්කාය දිට්ඨි විස්ස, විසි ආකාර සක්කාය දිට්ඨිය නමින් හඳුන්වනු ලබනවා.

1. රූපං අත්තතෝ සමනුපස්සති

රූපය ආත්මය වශයෙන් සලකයි. හුදෙක්ම තමාගේ රූපය හෙවත් කය, ශරීරය සත්ත්වයෙක් ලෙස, පුද්ගලයෙක්

ලෙස, ආත්මයක් ලෙස සැලකීම පළමුවන සක්කාය දිට්ඨියයි.

2. රූපවන්තං වා අත්තානං සමනුපස්සති

රූපයෙන් හටගත් ආත්මයක් ඇතැයි සලකයි. සමහර කෙනෙකුට ආත්මය සතර මහා ධාතූන්ගෙන් හටගත් දෙයක් බව සලකයි. එහිදී 'රූපය' යන වචනයෙන් පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහා ධාතූන් සලකනු ලබයි. 'ආත්මය' යන වචනයෙන් වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ හතර හඳුන්වයි. ඔවුන් සිතන ආකාරයට වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ හටගෙන තිබෙන්නේ සතර මහා ධාතූන් පදනම් කරගෙනය. සෙවණැල්ල සහිත ගසක් ඇත; එම ගසෙහි සෙවණැල්ල ගස නිසා හටගත් දෙයකි. එසේම ආත්මය, රූපය නිසා හටගත් දෙයක් බව දෘෂ්ටිය ඇති අය සිතයි, කල්පනා කරයි, අදහස් කරයි

3. රූපස්මිං වා අත්තානං සමනුපස්සති

රූපයෙහි ආත්මය ඇතැයි සලකයි. රූපය යන වචනයෙන් සතර මහා ධාතූන්ගෙන් හටගත් මේ කය හඳුන්වන අතර, ආත්මය යන වචනයෙන් වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ හතර හඳුන්වයි. මොවුන් සිතන ආකාරයට මේ ශරීරය නමැති භාජනය තුළ ආත්මය තිබේ. උදාහරණයක් ලෙස මල් ගඳ පිරුණු කරඬුවක් ඇත. එම කරඬුව රූපය වැනිය; එහි ඇති මල් සුවඳ ආත්මය වැනිය. කරඬුව තුළ මල් සුවඳ රැඳී පවතින්නා

සේ, රූපය නමැති ශරීරය තුළ ආත්මය පවතින බව මෙවැනි දෘෂ්ටිය ඇති අය සිතයි, කල්පනා කරයි, අදහස් කරයි.

4. අත්තනි වා රූපං සමනුපස්සති

ආත්මයෙහි රූපය ඇතැයි සලකයි. ආත්මය යන වචනයෙන් වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ හතර හඳුන්වන අතර, රූපය යන වචනයෙන් සතර මහා ධාතූන්ගෙන් හටගත් මේ කය හඳුන්වයි. මොවුන් සිතන ආකාරයට මේ මහා ආත්මය තුළ රූපය පිහිටා තිබේ. උදාහරණයක් ලෙස මැණිකක් බහාලූ කරඬුවක් ඇත. මෙහි කරඬුව ආත්මය වැනිය; එහි ඇතුළත ඇති මැණික රූපය වැනිය. ආත්මය නමැති කරඬුව තුළ රූපය පිහිටා පවතින බව මෙවැනි දෘෂ්ටිය ඇති අය සිතයි, කල්පනා කරයි, අදහස් කරයි.

වේදනා ස්කන්ධය පිළිබඳ සතර

5. වේදනං අත්තතෝ සමනුපස්සති

වේදනාව ආත්මය වශයෙන් සලකයි.

6. වේදනාවන්තං වා අත්තානං සමනුපස්සති

වේදනාවෙන් හටගත් ආත්මයක් ඇතැයි සලකයි.

7. වේදනාය වා අත්තානං සමනුපස්සති

වේදනාවෙහි ආත්මය ඇතැයි සලකයි.

8. අත්තනි වා වේදනං සමනුපස්සති

ආත්මයෙහි වේදනාව ඇතැයි සලකයි.

සංඥා ස්කන්ධය පිළිබඳ සතර

9. සංඤ්ඤං අත්තතෝ සමනුපස්සති

සංඥාව ආත්මය වශයෙන් සලකයි.

10. සංඤ්ඤාවන්තං වා අත්තානං සමනුපස්සති

සංඥාවෙන් හටගත් ආත්මයක් ඇතැයි සලකයි.

11. සංඤ්ඤාය වා අත්තානං සමනුපස්සති

සංඥාවෙහි ආත්මය ඇතැයි සලකයි.

12. අත්තනි වා සංඤ්ඤං සමනුපස්සති

ආත්මයෙහි සංඥාව ඇතැයි සලකයි.

සංඛාර ස්කන්ධය පිළිබඳ සතර

13. සංඛාරේ අත්තතෝ සමනුපස්සති

සංඛාර ආත්මය වශයෙන් සලකයි.

14. සංඛාරවන්තං වා අත්තානං සමනුපස්සති

සංඛාරයන්ගෙන් හටගත් ආත්මයක් ඇතැයි සලකයි.

15. සංඛාරේසු වා අත්තානං සමනුපස්සති

සංඛාරයන් තුළ ආත්මය ඇතැයි සලකයි.

16. අත්තනි වා සංඛාරේ සමනුපස්සති

ආත්මයෙහි සංඛාර ඇතැයි සලකයි.

විඤ්ඤාණ ස්කන්ධය පිළිබඳ සතර

17. විඤ්ඤාණං අත්තතෝ සමනුපස්සති

විඤ්ඤාණය ආත්මය වශයෙන් සලකයි.

18. විඤ්ඤාණවන්තං වා අත්තානං සමනුපස්සති

විඤ්ඤාණයෙන් හටගත් ආත්මයක් ඇතැයි සලකයි.

19. විඤ්ඤාණස්මිං වා අත්තානං සමනුපස්සති

විඤ්ඤාණයෙහි ආත්මය ඇතැයි සලකයි.

20. අත්තනි වා විඤ්ඤාණං සමනුපස්සති

ආත්මයෙහි විඤ්ඤාණය ඇතැයි සලකයි.

වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධයන් මුල් වී සක්කාය දිට්ඨිය හටගන්නා ආකාරය ඉහත දක්වන ලදී. වේදනාව ආත්මය වශයෙන් සලකයි; සංඥාව ආත්මය වශයෙන් සලකයි; සංස්කාර ආත්මය වශයෙන් සලකයි; විඤ්ඤාණය ආත්මය වශයෙන් සලකයි. මෙම කාරණා හතරේදී හුදෙක්ම වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධයන්ම ආත්මය වශයෙන් සලකන බව තේරුම් ගත යුතුය.

වේදනාවෙන් හටගත් ආත්මයක් ඇත; සංඥාවෙන් හටගත් ආත්මයක් ඇත; සංස්කාරයන්ගෙන් හටගත් ආත්මයක් ඇත; විඤ්ඤාණයෙන් හටගත් ආත්මයක් ඇත යන කාරණා හතරේදී 'ආත්මය' කියා හඳුන්වන්නේ එහි සඳහන් වන ස්කන්ධය හැර සෙසු ස්කන්ධ හතර බව වටහා ගත යුතුය.

වේදනාව තුළ ආත්මය ඇත; සංඥාව තුළ ආත්මය ඇත; සංස්කාර තුළ ආත්මය ඇත; විඤ්ඤාණය තුළ ආත්මය ඇත. මෙම හතරේදී 'ආත්මය' යනුවෙන් සලකන්නේ එහි සඳහන් වන ස්කන්ධය හැර අනෙක් ස්කන්ධ හතර බවද තේරුම් ගත යුතුය.

ආත්මය තුළ වේදනාව ඇත; ආත්මය තුළ සංඥාව ඇත; ආත්මය තුළ සංස්කාර ඇත; ආත්මය තුළ විඤ්ඤාණය ඇත. මෙම හතරේදී 'ආත්මය' ලෙස සලකන්නේ එහි සඳහන් වන ස්කන්ධය හැර සෙසු ස්කන්ධ හතර බව තේරුම් ගත යුතුය.

සක්කාය දිට්ඨිය හට ගැනීමට හේතුව

අවිද්‍යා සහගත ස්පර්ශයෙන් හටගත් වේදනා විඳින අශ්‍රැතවත් පෘථග්ජනයාට තණ්හාව උපදී. එම තණ්හාව නිසා "රූපය ආත්මය වශයෙන් සලකයි" යන සක්කාය දිට්ඨිය උපදී. (සංයුක්ත නිකාය - පාරිලෙය්‍ය සූත්‍රය).

සක්කාය දිට්ඨි විස්සම හට ගැනීමට හේතුව ඉහත සඳහන් කළ පාරිලෙය්‍ය සූත්‍රයට අනුව තේරුම් ගත යුතුය.

අවිද්‍යා සහගත ස්පර්ශයෙන් හටගත් වේදනා විඳින අශ්‍රැතවත් පෘථග්ජනයාට තණ්හාව උපදීමත්, එම තණ්හාව නිසා සක්කාය දිට්ඨිය හටගැනීමත් මෙහි ක්‍රියාවලියයි.

සක්කාය දිට්ඨිය හට ගැනීමට හේතු වන අවිද්‍යාව, ස්පර්ශය, වේදනාව, තණ්හාව සහ එම තණ්හාවෙන් පැනනගින ආත්ම දෘෂ්ටිය යන මේ සෑම අංගයක්ම:

ඛය ධම්මං: ක්ෂය වන ස්වභාවයෙන් යුක්තය.

වය ධම්මං: වැනසෙන ස්වභාවයෙන් යුක්තය.

විරාග ධම්මං: නොඇලිය යුතු ස්වභාවයෙන් යුක්තය.

නිරෝධ ධම්මං: නිරුද්ධ කළ යුතු ස්වභාවයෙන් යුක්තය.

අනිච්චං: අනිත්‍යය.

සංඛතං: හේතුන්ගෙන් හටගත් දෙයකි.

පටිච්චසමුප්පන්නං: ප්‍රතීත්‍යසමුප්පන්න දෙයකි.

මේ ආකාරයට තේරුම් ගැනීමෙන්, සක්කාය දිට්ඨිය යනු අනිත්‍ය වූ, දුක් වූ, අනාත්ම වූ, වෙනස් වන්නා වූ සහ දුරු කළ යුතු වූ දෙයක් බව මනාව පැහැදිලි කරගත හැකිය.

සක්කාය දිට්ඨිය පිළිබඳව කෙනෙකුට පැහැදිලි කර දීම ඉතා අපහසුය. ඇත්තටම සත්වයෙක්, පුද්ගලයෙක්, ආත්මයක් නැති දෙයක් පිළිබඳව විස්තර කරමින්, පැහැදිලි කරමින් තේරුම් කර දීමට හැකියාවක් ද නැත. කුඩා

දරුවෙකු තමා විසින්ම "ගෝනිබිල්ලෙකු" පිළිබඳව මනඃකල්පිත චිත්‍රයක් මවා ගනී. නමුත් සැබවින්ම ගෝනිබිල්ලෙකු කියා කෙනෙක් නැත. නැති කල්හි ගෝනිබිල්ලා කොපමණ උසද, සුදුද, කළුද, කෙට්ටුද, මහතද කියා විස්තර කර දිය නොහැකිය. සක්කාය දිට්ඨිය පිළිබඳව ද නිවැරදිව පැහැදිලිව විස්තර කිරීමක් කළ නොහැක්කේ ඒ හා සමාන බැවිනි. ත්‍රිපිටකයෙහි අන්තර්ගත වන ආකාරයටත්, අන්‍ය ශාස්තෘ ශාසනවල උගන්වන ආකාරය අනුවත් අප විසින් එය තරමක් පැහැදිලි කර දීමට කටයුතු කළෙමු.

සක්කාය දිට්ඨිය යනු පංච උපාදානස්කන්ධය පිළිබඳව අවබෝධයක් නැතිකම නිසාත්, යථාර්ථය තේරුම් නොගැනීම නිසාත් හටගන්නා ලද වැරදි අදහසක්, සංකල්පනාවක්, සිතුවිල්ලක් බව මේ වන විටත් ඔබට වැටහී ඇත. එසේ වැටහුණු පමණින්ම සක්කාය දිට්ඨිය දුරු වන්නේ ද නැත. එසේ වැටහීම ඔබ ඉගෙන ගැනීමක් වන අතර, එය ඉගෙන ගත් දෙය පිළිබඳව සිතා කල්පනා කර ඇති කර ගන්නා ලද තර්කානුකූල ඥානයකි (සින්තාමය ප්‍රඥාව). තර්කානුකූල ඥානයකින් පමණක් සක්කාය දිට්ඨිය දුරු කිරීම සිදු කළ නොහැකිය.

එසේ නම් සක්කාය දිට්ඨිය දුරු කරන්නේ කෙසේද? ඒ සඳහා මාවතක් තිබේද? එම මාවත කුමක්ද? සැබවින්ම සක්කාය දිට්ඨිය දුරු කිරීමට මාවතක් තිබේ. එම මාවත අනෙකක් නොව ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. පංච

උපාදානස්කන්ධය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා වඩන විට සක්කාය දිට්ඨිය දුරු වී යයි.

විචිකිච්ඡාව

නුවණින් තොරව කල්පනා කිරීම 'අයෝනිසෝ මනසිකාරය' නමින් හඳුන්වයි. අයෝනිසෝ යනු නුවණින් තොරව යන අර්ථය ඇති වචනයකි. මනසිකාරය යනු මෙනෙහි කිරීමයි. නුවණින් තොරව මෙනෙහි කරන තැනැත්තාට නූපන්නා වූ අකුසල ධර්ම උපදී; උපන්නා වූ අකුසල ධර්ම වර්ධනය වෙයි. විචිකිච්ඡාව යනු ද අයෝනිසෝ මනසිකාරය මුල් වී උපදින ක්ලේශ ධර්මයකි.

විචිකිච්ඡාවේ ආකාර අට මෙසේ හඳුනාගත යුතුය:

1. බුද්ධේ කංඛති විචිකිච්ඡති නාධිමුච්චති නප්පසීදති

බුදුරජාණන් වහන්සේ ගැන සැක කරයි; විචිකිච්ඡා කරයි; නිගමනය නොකරයි; පැහැදීමකට පත් නොවෙයි. බුදුරජාණන් වහන්සේ කියා කෙනෙක් සැබැවින්ම සිටියාද නැද්ද? උන්වහන්සේ තුළ අරහං, සම්මා සම්බුද්ධ ආදී ගුණ තිබුණාද නැද්ද? උන්වහන්සේගේ රූපකාය සම්පත්තිය තුළ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ, අසීති අනුව්‍යංජන ලක්ෂණ ආදී ආශ්චර්ය අද්භූත ධර්ම තිබුණාද නැද්ද? මෙසේ බුද්ධ රත්නය පිළිබඳව සැක කිරීම පළමුවන විචිකිච්ඡාවයි.

2. ධම්මේ කංඛති විචිකිච්ඡති නාධිමුච්චති නප්පසීදති

ධර්මරත්නය කෙරෙහි සැක කරයි; විචිකිච්ඡා කරයි; නිගමනය නොකරයි; පැහැදීමට පත් නොවෙයි. බුදුරජාණන් වහන්සේ තමා විසින්ම අවබෝධ කරගන්නා ලද ධර්මයක් දේශනා කළාද නැද්ද? එම ධර්මය තුළ ස්වාක්ඛාත ආදී දහම් ගුණ තිබුණාද නැද්ද? එම ධර්මය අනුව පිළිපදින කෙනෙකුට මාර්ගඵල ධර්මයන් අවබෝධ කරගත හැකිද නොහැකිද? මේ ආකාරයට ධර්මය මුල් වී උපදින සැකය දෙවන විචිකිච්ඡාවයි.

3. සංඝේ කංඛති විචිකිච්ඡති නාධිමුච්චති නප්පසීදති

සංඝරත්නය කෙරෙහි සැක කරයි; විචිකිච්ඡා කරයි; නිගමනයකට නොපැමිණෙයි; පැහැදීම ඇති කර නොගනියි. මාර්ගඵලලාභී ආර්ය සංඝ පිරිසක් සිටියාද නැද්ද? උන්වහන්සේලා තුළ සුපටිපන්න ආදී ගුණ තිබුණාද නැද්ද? උන්වහන්සේලා අතර සඳහන් කරන සංයෝජන ධර්ම ප්‍රහීණ කළ අය සිටියාද නැද්ද? එසේ විය හැකිද නොහැකිද? මේ ආකාරයට සංඝයා පිළිබඳ සැක කිරීම තුන්වන විචිකිච්ඡාවයි.

4. සික්ඛාය කංඛති විචිකිච්ඡති නාධිමුච්චති නප්පසීදති

සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂා පිළිබඳව සැක කරයි; විචිකිච්ඡා කරයි; නිගමනය නොකරයි; පැහැදීමට පත් නොවෙයි. සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂා වැඩීමෙන් ප්‍රතිඵලයක් ලැබේද නොලැබේද? මගඵල ලැබිය හැකිද නොහැකිද? මම අනුගමනය කරන මේ ප්‍රතිපත්ති මාර්ගය

හරිද වැරදිද? සාර්ථකද අසාර්ථකද? මේ ආකාරයට ඇති වන්නා වූ සැකය හතරවන විචිකිච්ඡාවයි.

5. පූර්වාන්තය පිළිබඳව සැකය

අතීතයෙහි මම සිටියාද? නොසිටියාද? කවරෙක්ව සිටියාද? කෙසේ සිටියාද? කවරෙක්ව සිට කවරෙක් වූයෙම්ද? මේ ආකාරයට අතීත ජීවිත පිළිබඳව සැක කිරීම පස්වන විචිකිච්ඡාවයි. හේතුඵල දහම අවබෝධ කර නොගැනීම නිසා සත්ත්වයා 'මම' කියා කෙනෙක් ඇතැයි සලකයි. එසේ සැලකීම හේතු කරගෙන "මම අතීතයේ සිටියාද නැද්ද?" යන මෙම විචිකිච්ඡාව හටගනී. නමුත් යෝනිසෝ මනසිකාරය මුල් කරගෙන හේතුඵල දහම හොඳින් අවබෝධ කරගත්තා වූ තැනැත්තාට "අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං..." යන න්‍යාය වැටහෙයි. චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ නොවීම නිසා පුණ්‍ය අභිසංස්කාර, අපුණ්‍ය අභිසංස්කාර හෝ ආනෙඤ්ජාභිසංස්කාර හෙවත් අරූපාවචර ධ්‍යාන කුසල් සිත් උපදී. මරණාසන්න මොහොතේදී ඉදිරිපත් වන එම සංස්කාරයක් හේතු කරගෙන ප්‍රතිසන්ධි විඤ්ඤාණය හටගන්නා බව ධර්මානුකූල න්‍යායයි. එය මනාව තේරුම් නොගත් තැනැත්තා අතීත භවය පිළිබඳව සැක සංකා උපදවා ගනී.

6. අපරාන්තය පිළිබඳ සැකය

"මම මරණින් පසු උපදීද? නූපදීද? කොහේ උපදීද? කෙසේ උපදීද? කවරෙක්ව උපදීද?" මේ ආකාරයට අනාගත

ජීවිතය පිළිබඳ ඇති වන සැකය හයවන විචිකිච්ඡාවයි. අනාගතය යනු හේතුඵල දහමකට අනුව සිදුවන ක්‍රියාදාමයකි. ධර්මය නොදන්නා තැනැත්තා එය අවබෝධ කර නොගනියි. අප විසින් රැස් කරගන්නා ලද කර්මයක්, එනම් මේ ජීවිතයේදී හෝ පෙර ජීවිතයකදී සිදු කරන ලද කුසල කර්මයක් මරණාසන්න මොහොතේ සිහියට නැගෙයි. එම කර්මය හේතු කරගෙන අනාගත ජීවිතයේ ඉපදීම සිදුවෙයි. මෙය මනාව අවබෝධ කර නොගැනීම නිසා සත්ත්වයෝ සැකයන් ඇති කර ගනිති. මෙය දුරු කර ගැනීමට නම් පටිච්චසමුප්පාදයෙහි එන තණ්හාව, උපාදානය, භවය, අවිද්‍යාව සහ සංස්කාර යන ධර්මතා පහ අවබෝධ කරගත යුතුය. රූපාදී අරමුණු මුල් වී හටගන්නා ආසාව තණ්හාවයි. තණ්හාව මුල් වීමෙන් උපාදානය හෙවත් දැඩි ග්‍රහණය හටගනී. උපාදානය මුල් කරගෙන කර්ම සකස් වීම (භවය) සිදු වෙයි. එම සකස් වන කර්මයන්ට අනුව නැවත ඉපදීම සිදු වෙයි. මෙම ක්‍රියාවලිය හේතුඵල දහමක් බව අවබෝධ වූ පසු "මම මතු උපදීද? නූපදීද?" යන ප්‍රශ්නය හට නොගනියි.

7. පච්චුප්පන්නේ කංඛති

වර්තමාන ජීවිතය පිළිබඳව සැක කරයි. "මම උපතට පෙර සිටියේ කොහේද? මරණින් මතු උපදින්නේ කොහේද? මම කියා කෙනෙක් සිටීද? නොසිටීද?" මේ ආකාරයට වර්තමාන ස්කන්ධ පංචකය පිළිබඳව සැක උපදී. එයට හේතුවත් හේතුඵල දහම නිසියාකාරව අවබෝධ කර නොගැනීමයි. "සංඛාර පච්චයා විඤ්ඤාණං" යනුවෙන්

කුසලාකුසල කර්මය නිසා ප්‍රතිසන්ධි විඤ්ඤාණය හටගන්නා ආකාරයත්, විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප, සළායතන, ස්පර්ශ, වේදනා, තණ්හා උපදින ආකාරයත් තේරුම් ගත යුතුය. එවිට මෙහි ඇත්තේ හේතුඵල දහමක් බවත්, සත්ත්වයෙක් පුද්ගලයෙක් නැති බවත් වැටහෙනු ඇත. මෙය සපුරා දුරු වන්නේ සෝතාපත්ති මාර්ග චිත්තයෙනි.

8. පටිච්චසමුප්පන්නේ කංඛති

පටිච්චසමුප්පාදය පිළිබඳව සැක කරයි. ධර්මාවබෝධයක් නැති කෙනා තමා තුළ පවතින "සත්වයෙක් ඇත, පුද්ගලයෙක් ඇත, ආත්මයක් ඇත, මම කියා කෙනෙක් ඇත" යන දැඩි ආත්මවාදී අදහස නිසාම පටිච්චසමුප්පාදය තේරුම් නොගනියි. හේතුඵල දහම නොවැටහීම නිසා පටිච්චසමුප්පාදය ගැන සැක ඇති වීම සාමාන්‍ය දෙයකි.

මෙහි සඳහන් කරන ලද විචිකිච්ඡා අටම සෝතාපත්ති මාර්ගයේදී ප්‍රහාණය වන බව ඉතා හොඳින් වටහා ගත යුතුව ඇත.

සීලබ්බත පරාමාස

සීල සහ වෘත දැඩි ලෙස සිතින් පරාමර්ශනය කිරීම මෙ නමින් හඳුන්වයි. ඔබ ගවයෝ දැක ඇත; ඔවුන් පා හතරෙන් ඇවිදගෙන යති, බිම ලගිති, බිමට දැමූ දෙය මුවින් ගෙන කති, දිය ඇති තැනකින් මුවින්ම වතුර පානය කරති. සමහර යෝගීහු සතුන්ගේ ක්‍රියාකාරකම් අනුව

හැසිරීම තුළින් කෙලෙස් දුරු කරගත හැකි යැයි කල්පනා කළහ, සිතුහ. එය 'සීල' නම් වේ. තමාද එම වත සමාදන්ව අත් දෙක බිම තබා සතෙකු සේ ඇවිදීම, සතෙකු සේ ආහාර ගැනීම, සතෙකු සේම ජලය පානය කිරීම, සතෙකු සේ බිම නිදා ගැනීම ආදිය කරති. එය 'වෘතය' නම් වේ.

සමහර කෙනෙක් ගවයකු මෙන් හැසිරීමේ 'ගෝ වෘතයත්', එළුවෙකු සේ හැසිරීමේ 'අජ වෘතයත්', බල්ලෙකු සේ හැසිරීමේ 'කුක්කුර වෘතයත්' සමාදන්ව කටයුතු කරති. එය මිථ්‍යා දෘෂ්ටියක් පදනම්ව ඇති වන වැරදි ක්‍රියාදාමයකි. ඒ තුළින් කේසේවත් කෙලෙස් නැති වීමක් සිදු නොවේ; චිත්ත සන්තානය පිරිසිදු වීමක් සිදු කළ නොහැකිය.

තව සමහර කෙනෙකු ගිනි මැල හතරක් ගසා, ගිනි මැල හතරෙන්ද උඩින් වැටෙන හිරු එළියෙන්ද තම ශරීරය දවන, තවන වෘත අනුගමනය කරති (පංච තපස්). එසේම සීතල කාලවලදී ජලයෙහි බැසීමේ වෘතයද අනුගමනය කරති. කටු මත නිදා ගැනීම, වාඩි වී සිටීම ආදියද කරති. තනි කකුලෙන් සිටගෙන සිටීම වැනි දරුණු වෘතයන්ද සමාදන්ව වාසය කරති. ඒවාද සීලබ්බත පරාමාසයෝය.

සම්මා දිට්ඨිය මනාව ඇති කර ගැනීමෙන්, එබඳු ක්‍රමවලින් නිර්වාණ අවබෝධය කළ නොහැකි බව සත්ත්වයා වටහා ගනී. නිර්වාණාවබෝධයට නම් ක්‍රමානුකූලව සීල, සමාධි, ප්‍රඥා වැඩිය යුතු බව ඔවුහු තේරුම් ගනිති. සක්කාය

දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන සසරෙහි බැඳ තබන මේ සංයෝජන තුන සෝතාපත්ති මාර්ගයෙන් ප්‍රහාණය වන්නේය.

කාමරාග සංයෝජනය

රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන කාම වස්තූන් කෙරෙහි ඇති වන ආසාව, ඇලීම, ආලය, ප්‍රේමය, සෙනෙහස සහ බැඳීම කාමරාගය නම් වෙයි. එය සුභ නිමිත්තත්, අයෝනිසෝ මනසිකාරයත් නිසා උපදී.

සුභ නිමිත්ත යනු ප්‍රියමනාප වූ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන ධර්මයෝය.

අයෝනිසෝ මනසිකාරය යනු නුවණින් තොරව කල්පනා කිරීමයි.

ඇසට රූපයක් හමුවූ විට එම රූපය පිළිබඳව නුවණින් තොරව කල්පනා කරන තැනැත්තාට, ලස්සන ප්‍රියමනාප වූ රූපය කෙරෙහි ආසාව, ඇලීම, බැඳීම සහ තණ්හාව හට ගනී. එය කාමරාගයයි. මේ ආකාරයෙන්ම ශබ්දය, සුවඳ, රසය සහ ස්පර්ශය මුල් වී කාමරාගය හටගන්නා ආකාරය තේරුම් ගත යුතුය.

සත්ත්වයා සංසාරයෙහි බැඳ තබන ඉතාම ප්‍රබල ක්ලේශයක් වන කාමරාගය සංයෝජනයක් ලෙසද හඳුන්වනු ලබයි. සංයෝජන යන වචනයේ අර්ථය ද

සසරින් ගැලවීමට යා නොදී, සසරෙහිම බැඳ තබන ස්වභාවයක් හෙවත් ක්ලේශයක් යන්නයි.

ව්‍යාපාද සංයෝජනය

තරහ, වෛරය, කෝපය, පළිගැනීම, එකට එක කිරීම, ඉරිසියාව, පිළිකුල, අප්පිරියාව සහ කැත යන නම් වලින් හඳුන්වන්නේ ව්‍යාපාදයයි. පටිඝ නිමිත්තත්, අයෝනිසෝ මනසිකාරයත් නිසා ව්‍යාපාදය හටගනී.

පටිඝ නිමිත්ත යනු අකමැති රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සහ සිතුවිලි යන ධර්මයෝය.

අයෝනිසෝ මනසිකාරය යනු අකමැති, අප්‍රිය, අමනාප රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සහ සිතුවිලි ලැබුණු අවස්ථාවලදී නුවණින් තොරව ඒ පිළිබඳව කල්පනා කිරීමයි.

එසේ කල්පනා කරන විට නූපන්නා වූ ව්‍යාපාදය උපදී; උපන්නා වූ ව්‍යාපාදය වර්ධනය වෙයි. අයෝනිසෝ මනසිකාරය පිළිබඳව සබ්බාසව සූත්‍රයෙහි මනා පැහැදිලි කිරීමක් ඇත. අයෝනිසෝ මනසිකාරය යනු නූපන්නා වූ කාමාශ්‍රව, භවාශ්‍රව, අවිද්‍යාශ්‍රව උපදින ආකාරයට කල්පනා කිරීමයි. එසේ කල්පනා කිරීමේදී උපන්නා වූ කාමාශ්‍රව, භවාශ්‍රව, අවිද්‍යාශ්‍රව වර්ධනය වෙයි. මේ අනුව සරලව කිවහොත්, අයෝනිසෝ මනසිකාරය යනු ලෝභ, ද්වේෂ, මෝහ වර්ධනය වන ආකාරයට කල්පනා කිරීමයි.

සකෘදාගාමී මාර්ගයේදී කාමරාගය මෙන්ම ව්‍යාපාදය ද තුනී බවට පත්වෙයි. අනාගාමී මාර්ගයේදී ව්‍යාපාදය සම්පූර්ණයෙන්ම ප්‍රහීණ වෙයි.

සත්ත්වයා තුළ උපදින ක්ලේශයන් අතර ව්‍යාපාදය ඉතා දරුණු ක්ලේශයක් ලෙස හඳුන්වයි. එයට හේතුව වන්නේ ව්‍යාපාදයෙන් යුතු තැනැත්තා ඉතා දරුණු අපරාධ ක්ෂණයකින් සිදු කරනු ලබන බැවිනි.

රූප රාග සංයෝජනය

රූපාවචර ධ්‍යාන කෙරෙහි ඇති ආශාවෙන් හෙවත් තණ්හාවෙන් රූප රාග සංයෝජනය නම් වේ. රූපාවචර ධ්‍යාන ලබා ගත් කෙනෙකුට එම ධ්‍යාන සමාධීන් කෙරෙහි ඉතා සියුම් ඇල්මක් පවතී. එය ධ්‍යාන නිකාන්තිය යන නමින්ද හඳුන්වනු ලබයි. එම ධ්‍යාන නිකාන්තියත් රූපාවචර බ්‍රහ්ම ලෝක කෙරෙහි ඇති කැමැත්තත් රූපරාගය නමින් හඳුන්වනු ලබයි. මෙය අරිහත් මාර්ගයෙන් ප්‍රහාණය වන ක්ලේශ ධර්මයකි.

කසින භාවනාවක් මනාකොට පුරුදු කරගත් කල්හි තැනැත්තාට කසින ආලෝකය දර්ශනය වෙයි. එය මෙසේ පැහැදිලි කර දිය හැකිය. සාමාන්‍යයෙන් පිඟානක් තරම් ලොකු, එනම් වියතක් තරම් ලොකු රවුමක් සකස් කරගන්න. රවුම් පුවරුව මත අරුණුවන් මැටි තැන්පත් කොට, නැවත නැවත මැටි ගාමින් කඩතොලු නොසිටින සේ රොටියක් වැනි විදිහට සකස් කරගන්න. අඩියක්

පමණ උස ආසනයක් භාවනා කිරීමට පිළියෙල කර ගැනීම මැනවි. එම ආසනයෙහි වාඩි වී රියන් දෙකහමාරක් පමණ දුරින් කසින මණ්ඩලය බිම තබන්න. බිම තැබීමේදී එය පොළොවෙහි පිහිටා තිබෙන විදිහට තැන්පත් කළ යුතුය. එසේ තැන්පත් කොට තෙරුවන් වැඳ පුදා, තෙරුවන්ට ජීවිතය පූජා කොට කසින මණ්ඩලය අඩවන් නෙතින් බලමින් 'පඨවි, පඨවි, පඨවි' යනුවෙන් සිහි කරන්න. එසේ සිහි කරන අතරතුර වරින් වර දෙනෙත් පියාද සිහි කරන්න.

ඒ විදිහට කලක් පුරුදු පුහුණු වූ පසු දෙනෙත් පියා සිහි කරන විට කසින මණ්ඩලය සිතට පෙනෙන්නට වන්නේය. එසේ කසින මණ්ඩලය සිතට පෙනෙන කල්හි එම ස්ථානයෙන් නැගිට 'පඨවි, පඨවි' යන වචනයම සිහි කරමින් වෙනත් ස්ථානයකට ගොස් වාඩි වී භාවනා කළ යුතුය. එසේ භාවනා කරන විටත් කසින මණ්ඩලය මනාව පෙනේ නම් ඉතා යහපත්ය. නොපෙනී යන්නේ නම් කසින මණ්ඩලය පිහිටි තැනට පැමිණ නැවත කසින මණ්ඩලය දෙස බලා නිමිති ගත යුතුය.

මේ ආකාරයට පුරුදු කරන ලද කල්හි කසින මණ්ඩලය මනාව භාවනා කරන මොහොතේ සිතට දර්ශනය වේ නම්, එහි බබලන ස්වභාවයකුත් හිතට පෙනේ නම් එම අවස්ථාවේදී "මාගේ කසින මණ්ඩලය අඟලක් පමණ විශාල වේවා" යි අධිෂ්ඨාන කරන්න. එසේ අධිෂ්ඨාන කොට නැවතත් 'පඨවි, පඨවි, පඨවි' යනුවෙන් කසින මණ්ඩලය සිහි කරන්න. එවිට ටික වේලාවක් යන විට

කසින මණ්ඩලය අඟලක් පමණ ලොකු වී ඇති ආකාරය දර්ශනය වේ. එසේ දර්ශනය වන්නේ නම් කසින මණ්ඩලය අඟල් දෙකක් පමණ විශාල වනු කියා පෙර පරිදිම භාවනා වඩන්න.

ඔය ආකාරයට ටිකෙන් ටික විශාල කොට මා සිටින කාමරය තරම් විශාල වේවා! මා සිටින ඉඩම තරම් විශාල වේවා! මේ ගම තරම් විශාල වේවා! මෙම නගරය තරම් විශාල වේවා! මෙම දිස්ත්‍රික්කය තරම් විශාල වේවා! මෙම පළාත තරම් විශාල වේවා! මෙම රට තරම් විශාල වේවා! මේ විදිහට ටිකෙන් ටික විශාල කර ගත යුතුය. එසේ විශාල කර ගන්නා අතරතුර යම් මොහොතක අධිෂ්ඨාන කරමින් භාවනා කළත් කසින මණ්ඩලයෙහි විශාලත්වයක් දක්නට නොලැබේ නම් එවිට නතර කළ යුතුය. නතර කොට කසින මණ්ඩලය අරමුණු කරගෙන භාවනා කරන්න. 'පඨවි, පඨවි' කියා මෙනෙහි නොකර, සිත පවත්වාගෙන සිටිමින් පැයක් පමණ කාලයක් කසින මණ්ඩලය තුළ හිත පවත්වා ගන්නට පුළුවන්කම තිබේ නම් ඉතා දියුණු අවස්ථාවක් ලෙස සිතිය හැකිය.

පසුව මෙසේ අධිෂ්ඨාන කරන්න: "මාගේ කසින මණ්ඩල සමාධිය විනාඩි පහක් පවතීවා." එසේ අධිෂ්ඨාන කොට නැවත කසින මණ්ඩලය මෙනෙහි කරන විට, කසින මණ්ඩලය සිතට දර්ශනය වී විනාඩි පහක් පැවතී නැති වී යා හැකිය. නැති වී යාම සිදු වුවහොත් ඒ මොහොතේදීම නැවත නැවත මෙසේ සිතන්න: "මේ කසින මණ්ඩලය මාගේ හෘදය වස්තුව තුළ දර්ශනය වේවා." අන්න ඒ

අවස්ථාවේදී හදවතෙහි කසින මණ්ඩලය පෙනෙන්නට වන්නේය. එම අවස්ථාවේ විතක්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා කියන ධ්‍යාන අංග විමසා බලන්න. එම ධ්‍යාන අංග විමසා බලන විට ඔබට ඒවා මනාව ප්‍රකට වන්නේ නම් එය ප්‍රථම ධ්‍යානය බව දත යුතුය. මෙබඳු තත්ත්වයකට පත්වීමේදී ගුරු උපදේශ ඇතුවම භාවනා කිරීම වටී. රූපාවචර ධ්‍යාන පිළිබඳව යම් හෝ සරල දැනුමක් ඇති කිරීම සඳහා මේ විස්තරය පවසන ලදී. මේ විස්තරයෙන් පමණක්ම භාවනා කිරීමට නොයන්න; ගුරු උපදේශ ඇතුවම භාවනා වඩන්න

අරූප රාගය

අරූපාවචර ධ්‍යාන කෙරෙහි පවතින සියුම් ඇල්ම 'ධ්‍යාන නිකාන්තියයි'. එම අරූපාවචර ධ්‍යාන නිකාන්තියත්, එසේම අරූපාවචර බ්‍රහ්ම ලෝක කෙරෙහි ඇති තණ්හාවත් අරූප රාග නමින් හඳුන්වනු ලබයි. ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නේවසඤ්ඤානාසඤ්ඤායතනය යනුවෙන් අරූපාවචර ධ්‍යාන හතරක් තිබේ.

කසින භාවනා වඩා නිමිති උපදවා ගත් කෙනෙකු රූපාවචර ධ්‍යාන හතර ලබා ගැනීමෙන් පසු, තමන් ලබාගත් එම කසින භාවනා ආලෝකය විහිදුවා, එම ආලෝකය විහිදුවා ඇති ප්‍රදේශය අහස ලෙස සලකා

'ආකාසෝ අනන්තෝ, ආකාසෝ අනන්තෝ' කියා මෙනෙහි කරමින් භාවනා වඩයි. එවිට ඇති වන්නා වූ සමාධිය ආකාසානඤ්චායතන සමාධිය නම් වේ.

එම සමාධිය උපදවා ගත් තැනැත්තා විසින් අනන්ත වූ ආකාශය (මෙහි ආකාශය යනු කසින ආලෝකය පැතිරී පවතින භූමි ප්‍රදේශයයි) අරමුණු කිරීමට නම් අහසටත් වඩා සිත අනන්ත විය යුතුය. එබැවින් අනන්ත වන්නේ අහස නොව සිතයි හෙවත් විඤ්ඤාණයයි. එසේ සිතා 'විඤ්ඤාණය අනන්තයි, විඤ්ඤාණය අනන්තයි' යනුවෙන් මෙනෙහි කරනු ලැබේ. එසේ මෙනෙහි කිරීමෙන් උපදින්නා වූ සමාධිය විඤ්ඤාණඤ්චායතන සමාධිය නමින් හඳුන්වයි.

ඉන්පසුව අනන්ත වූ ආකාශය අරමුණු කරන්නේ විඤ්ඤාණයෙනි. විඤ්ඤාණය හැර අනන්ත වූ කිසිවක් නැත යන අර්ථයෙන් 'නත්ති කිඤ්චි, නත්ති කිඤ්චි' (කිසිවක් නැත, කිසිවක් නැත) යන භාවනා අරමුණ මෙනෙහි කරමින් භාවනා කළ යුතුය. එසේ භාවනා වඩන විට ඇති වන්නා වූ සමාධිය ආකිඤ්චඤ්ඤායතනයයි.

විඤ්ඤාණය හැර අනන්ත වූ කිසිවක් ඇත්තෙත් නැත, නැත්තෙත් නැත යනුවෙන් මෙනෙහි කිරීම තුළින් උපදින්නා වූ සමාධිය නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාධිය නම් වේ. මෙම සමාධි කෙරෙහි ඇති ඉතා සියුම් ඇල්ම හෙවත් අරූප ධ්‍යාන නිකාන්තියත්, අරූපාවචර බ්‍රහ්ම ලෝක කෙරෙහි ඇති තණ්හාවත් අරූප රාග නම් වේ.

මාන සංයෝජනය

සෑම කෙනෙකුම තමා පිළිබඳව එක්තරා මැන ගැනීමක් සිදු කරනු ලබයි. එම මැන ගැනීම 'මානය' නමින් හඳුන්වනු ලැබේ. තමා උසස් යැයි කියා සිතීම සෙය්‍ය මානය නමින්ද, තමා අන් අයට සමානයි කියා සිතීම සදිස මානය නමින්ද, තමා අන් අයට වඩා පහත් යැයි සිතීම හීන මානය නමින්ද හඳුන්වනු ලැබේ. මෙම ත්‍රිවිධ මානය කොටස් නවයකට බෙදී යන ආකාරය ත්‍රිපිටක ධර්මයෙහි මනාව පැහැදිලි කොට ඇත.

සෙය්‍යස්ස සෙය්‍යෝ: මම උසස් කෙනෙක්, මම උසස් වූ අන් අයටත් වඩා උසස් කෙනෙක් වන්නෙමි යනුවෙන් සිතන මානයයි.

සෙය්‍යස්ස සදිසෝ: තමා උසස් කෙනෙකු ලෙස සලකා, උසස් වූ අන් අය හා තමා සම කර සිතන ස්වභාවයයි.

සෙය්‍යස්ස හීනෝ: තමා උසස් වුවත්, උසස් වූ අන් අයට වඩා තමා පහත් යැයි සිතන ස්වභාවයයි.

සදිසස්ස සෙය්‍යෝ: තමාට සමාන අයට වඩා තමා උසස් යැයි සිතන මානයයි. (උදාහරණ: එකම උපාධිය ගත් දෙදෙනෙකුගෙන් එක් අයෙක් දක්ෂ නම්, "අසවල් තැනැත්තා මට සමාන වුවත් මම ඔහුට වඩා දක්ෂ බැවින් ඔහුට වඩා උසස් වෙමි" යනුවෙන් සිතීම.)

සදිසස්ස සදිසෝ: තමා සමානයන් හා සමාන වෙමි යයි සිතන ස්වභාවයයි.

සදිසස්ස හීනෝ: තමාට සමාන කෙනාට වඩා තමා පහත් යැයි සිතන ස්වභාවයයි.

හීනස්ස සෙයෝ: පහත් කෙනාට වඩා තමා උසස් යැයි සිතන ස්වභාවයයි.

හීනස්ස සදිසෝ: පහත් කෙනාට තමා සමාන යැයි සිතන ස්වභාවයයි.

හීනස්ස හීනෝ: පහත් කෙනාටත් වඩා තමා පහත් යැයි සිතන ස්වභාවයයි.

මෙම නවවිධ මානයම අරිහත් මාර්ගයෙන් සපුරා ප්‍රහීණ වෙයි.

උද්ධච්ච සංයෝජනය

සිතෙහි පවතින විසුරුණු ස්වභාවය 'උද්ධච්ච' නමින් හඳුන්වයි. "බහිද්ධා වික්ඛිත්තං හෝති චිත්තං" යනුවෙන් සිත බාහිරට විසිරීම උද්ධච්චය වන බව බුද්ධ දේශනාවෙහි සඳහන්ය. එක අරමුණක සිත නොපැවති, නොයෙක් නොයෙක් අරමුණු වෙත ගමන් කරන ස්වභාවය උද්ධච්චය නමින් හඳුන්වනු ලැබේ. සමාධිමත් නැති අවස්ථාවේ සිත තුළ පවතින්නේ මේ උද්ධච්ච ස්වභාවයයි. සිතක් එක අරමුණක තබා ගැනීම අපහසු කරන ස්වභාවය උද්ධච්චයේ ලක්ෂණයයි.

අවිද්‍යා සංයෝජනය

යමක යථාර්ථය නොදැනෙන, නොපෙනෙන ලෙස වසන ස්වභාවය අවිද්‍යාව නම් වේ. අනිත්‍ය වූ දෙය නිත්‍ය ලෙස වැටහෙයි. දුක් වූ දෙය සැපයක් ලෙස වැටහෙයි. අනාත්ම වූ දෙය ආත්මයක් ලෙස වැටහෙයි. අසුභ වූ දෙය සුභ දෙයක් ලෙස වැටහෙයි. මෙම වරදවා ගත් හඳුනා ගැනීම හෙවත් සංඥා විපල්ලාසය හටගන්නේ අවිද්‍යාව නිසාය.

අවිද්‍යාව හට ගැනීමටත් හේතුවක් තිබේ. පංච නීවරණ ධර්මයන් නිසා අවිද්‍යාව හටගන්නා බව බුද්ධ දේශනාවේ සඳහන් වෙයි. එසේම කාමාශ්‍රව, භවාශ්‍රව, අවිජ්ජාශ්‍රව නිසාද අවිද්‍යාව උපදින බව බුද්ධ දේශනාව තුළ පැහැදිලි කර දෙයි. මජ්ඣිම නිකායේ සම්මා දිට්ඨි සූත්‍රය බැලීමෙන් එය මැනවින් තේරුම් ගත හැකිය.

කෙටියෙන්ම සඳහන් කළහොත් දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන චතුරාර්ය සත්‍ය ධර්මය තත්ත්වාකාරයෙන් අවබෝධ නොවීම අවිද්‍යාවයි. පංච උපාදානස්කන්ධය දුකක් වුවත්, අවිද්‍යාව ඇති කල්හි එය සැපයක් ලෙස වැටහෙයි. තණ්හාව දුකට හේතුව වුවත්, අවිද්‍යාව ඇති කල්හි තණ්හාව හෙවත් ආසාව සැපයට හේතුවක් බව වැටහේ. තණ්හාවෙන් නිදහස් වීම හෙවත් නිර්වාණය පරම සැපයකි. එහෙත් අවිද්‍යාව ඇති තැනැත්තාට නිර්වාණය මහත් වූ දුකක් ලෙස හෝ දුෂ්කර ප්‍රතිපදාවක් ලෙස වැටහෙනු ඇත.

ඉතා සරලව දස සංයෝජන පිළිබඳව අප මෙහිදී විස්තර කළෙමු. ගැඹුරු විස්තර දැන ගැනීමට කැමති සත්පුරුෂයන් විසින් අභිධර්ම ග්‍රන්ථයන් බලා ඒ පිළිබඳ ගැඹුරු විස්තර ඉගෙන ගත යුතුය. නමුත් මෙහිදී සාමාන්‍ය ජනතාවට තේරුම් කර දීම සඳහා පමණක් මෙම විස්තරය ලියන ලද බව කරුණාවෙන් සලකන්න.

දස සංයෝජන පිළිබඳ සංසිප්ත සටහනක් ලියා තැබීමෙන් අත්පත් වූ කුසලය ලියන ලද අපටත්, කියවන ලද ඔබ හැම දෙනාටමත් ඒකාන්තයෙන්ම අත්පත් වේවා! මේ උදාර වූ කුසලය ඉතා ඉක්මන් භවයකදී නිර්වාණ ධාතුව සුවසේ අවබෝධ කර ගැනීම පිණිස උපකාර වෙත්වායි ප්‍රාර්ථනා කරමි.

සැම දෙනාටම තෙරුවන් සරණයි!

https://www.nipunadhamma.org

https://www.nipunadhamma.org